


කේ.එම්.ලිනේජා ලක්නාරා අනුත්මි කරුණාතිලක

# මිතුදම

කතෘ :- කේ.එම්. ලිනේජා ලක්නාරා අනුත්මී කරුණාතිලක

කෘතිය පළ කරන දිනය :- 2025 - 02 -05

INSB අංකය :- 978-624-208-632-3

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගිම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකිම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරිම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 . 10 . 20

# පිදුම

ආදරණීය ........

ගුරුමෑණියන්ටත්....

යහළු යෙහෙළියන්ටත් .....

ආදරයෙන් පුදමි! .......

## ස්තූතිය

**මෙම පොත සකස් කිරීමට**
**මා හට උදව් කල**
**මගේ ආදරණීය...**
**අමිතා ගුරුතුමියටත්**
**යහළු යෙහෙළියන්ටත්**
**අනෙක් සියළු දෙනාටමත්**
**මගේ ස්තූතිය!**

*ලිනේෂා ලක්තාරා*

සුන්දර ගමක  පුංචි පවුලක සදුනි ජීවත් වුනා. එයා හරිම අහිංසක ළමයෙක්, එයාට අම්මා විතරයි හිටියේ. තාත්තා සදුනී පොඩි කාලේ මිය ගොස් තිබුණා. අම්මා ගෙවල්වල වැඩ පල කරමින් තමයි සදුනිව ජීවත් කලේ.

“අම්මේ , මම ශිෂ්‍යත්වය විභාගේ පාස්, ලංකාවෙන්ම පළවෙනියා. කියා කෑගසමින් පැමිණි සදුනි අම්මාව බදාගෙන හඬන්නට වුණා.

අම්මේ , තාත්තාත් හිටියනම් අද එයා ගොඩක් සතුටු වෙයි නේද?, සදුනි හඬමින් කීවා.



ඔයාගේ තාත්තා කොහේ හරි ඉදන් ඔයා දිහා බලන් අද සතුටු වෙනවා ඇති මගේ පුතේ, මගේ පුතා දුක් වෙන්න එපා. අම්මා කීවා.


අම්මේ ප්‍රින්සිපල් සර් කිවා සදුදා එනකොට අම්මා ස්කෝලෙට එක්ක ගෙන එන්න කියලා. අම්මා එනවා නේද? කියා සදුනි ඇහුවා.

එනවා මගේ පුතේ. අපි දෙන්නම සදුදා උදෙන්ම ස්කෝලෙට යමු. නොඉවසිල්ලෙන් බලා සිටි සදුනි එදින උදෙන්ම අවදි වී අම්මා සාදා දුන් තේ කෝප්පය බිලා පාසලට යාමට සුදානම් වුණා. අම්මාද සමගින් සදුනි පාසල වෙත ගොස් පාසලේ විදුහල්පතිතුමා හමුවුණා.




සදුනිගේ අම්මේ අපේ සදුනි දූ පාසලට ලොකු කීර්තියක් ලබා දුන්නා. ගමේ පාසලකින් ලංකාවේ පළමු වැනියා වුණා. ඒක අපේ පාසලට ලොකු ආඩම්බරයක්, ඉතිං සදුනිගේ අම්මේ, සදුනිට ලොකු අවස්ථාවක් ලැබිලා තියෙනවා නගරේ පාසලකට ඇතුලත් වෙන්න. මේක සදුනිගේ වාසනාව. විදුහල්පතිතුමා කීවා.

අම්මා ලොකු හුස්මක් අරගෙන ඒක තමා ප්‍රින්සිපල් සර් මමත් මේ කල්පනා කලේ. මම කොහොමද මේ දේවල් කර ගන්නේ කියලා. හරියට රස්සාවක් නෑ. දරුවාගේ විදයම් මට දරාගන්න පුළුවන් වෙයිද කියලා තමා ප්‍රශ්නෙ තියෙන්නේ ප්‍රින්සිපල් සර් කියා අම්මා කීවා.



මේ දරුවගේ දක්ෂතාවය නිසා ලැබුණ වටිනා අවස්ථාවක්, පුළුවන් උදව්වක් පාසල වෙනුවෙන් අපිත් කරන්නම්, කල්පනා කරලා මට උත්තරයක් දෙන්නකෝ සදුනිගේ අම්මේ, කියා විදුහල්පති තුමා කිව්වා. සදුනි දුකින් අම්මාගේ මුහුණ දිහා බලලා අම්මාට තුරුළු වුණා.

නිවසට එනතුරුම අම්මාත් සදුනිත් කිසිම දෙයක් කතා කලේ නෑ. සදුනිත් අම්මාත් නිවසට ඇවිත් ටික වේලාවක් කල්පනාවෙන් හිටියා.



මගේ පුතා දුක් වෙන්න  එපා. මගේ පුතාට ලොකු ස්කෝලෙට යන්න පුළුවන්. මම ඔයාට පොරොන්දු වෙනවා. කියා අම්මා කීවා.

ඇත්තමද අම්මේ, ඒත් ............ ගොඩාක් වියදම් යනවලු නේද ලොකු ස්කොල වලට. අම්මා අපට ඒ සල්ලි හොයා ගන්න පුළුවන් වෙයිද ? කියා සදුනි අම්මාගෙන් ඇසුවා.

මගේ පුතා මම මොනවා හරි දෙයක් කරලා මගේ පුතාව ලොකු ස්කොලෙට යවනවා. මගේ පුතා හොදට ඉගෙන ගන්න. රටට හොද පුරවැසියෙක් වෙන්න.  කියා අම්මා කිවා.



සදුනිගේ අම්මාට ගමේ ස්කොලේ විදුහල්පතිතුමා විසින් ලොකු ස්කොලේ ළඟින්ම ගෙදරක වැඩක් හොයලා දුන්නා. ඒ අසලම වූ පොඩි කඩ කාමරයක සදුනිත් අම්මාත් පදිංචියට ගියා. සදුනිට ලොකු ස්කෝලෙට යන්න අවස්ථාව ලැබුණා. සදුනි ගොඩාක් සතුටින් පාසල් ගියා. නමුත් සදුනිට පාසලේ යාළුවෝ කවුරුත් හිටියේ නෑ. සදුනි ඒ ගැනි අම්මාට කීවේ නෑ . අම්මාට දුක හිතෙයි කියලා. සදුනිගේ බලාරොත්තුව වුනේ කොහොම හරි හොදින් ඉගෙන ගෙන අම්මාව බලා ගන්න පුළුවන් රැකියාවක් කිරිමටයි.



ටික කාලයක් ගත වුණා. සදුනි පාසලේ තනිවම කාලය ගත කලා. පාසලේ හොඳින් ඉගෙන ගත්තා.

දිනක් සදුනි පාසල නිම වී පංති කාමරයේ තම මේසය උඩ ඔළුව තියාගෙන හිටියා. එතැනට ආ පවනී ආ........ මේ මොකද මේ. අද ගෙදර යන්නේ නැද්ද? අපි වගේ ස්පෝර්ට් කරන්නෙත් නෑ. ඉතිං මොකද මේ? කියා සිනාසෙමින් ඇසුවා.

සදුනි ඔළුව ඔසවා නෑ මම ටිකක් හිටියා. පවනී ඔයා ගෙදර ගියේ නැද්ද සදුනි ඇහුවා. නෑ අද මට හොකී ප්‍රැක්ටිස් තියෙනවා. පවනී කීවා.

පවනී ඔයාට පුළුවන්ද මට වතුර ටිකක් දෙන්න. මගේ ඔළුව රිදෙනවා. කියා සදුනි ඇසුවා..



ඇයි ඔයාට, ඔයා දවල්ට කෑවේ නැද්ද ? මොකද ඔයාට? කියා පවනී ඇසුවා. නෑ පවනී, මට කෑම ගේන්න බැරි වුණා. සදුනි කීවා.

ඉන්න මම ප්‍රැක්ට්‍රිස් වෙලාවට කන්න ගෙනාපු කෑම එක තියෙනවා. මම ඒක ඔයාට දෙන්නම් පවනී කිවා.

එපා ඔයා කන්න, මට ටිකකින් හරියාවි, එතකොට මට ගෙදර යන්න පුළුවන් සදුනි කීවා. නෑ එහෙනම් අපි දෙන්නම කෑම එක කමු. පවනී කීවා.

දෙදෙනාම කෑම ඒක කෑවා. පවනීට සදුනි ගැන ගොඩාක් දුක හිතුණා. ටික වේලාවකින් සදුනි නිවසට ගියා.

පවනී නිවසට ගොස් ඇයගේ මවට සියළු දේ පැවසුවා.



අම්මේ සදුනිගේ තාත්තත් නෑ. අම්මයි එයයි විතරයි ඉන්නේ. අපේ ස්කෝලේ ළග තමයි ඉන්නේ. මට ගොඩාක් දුක හිතුණා සදුනි ගැන. එයා හරි පව් අමමේ. එයාට අපි උදව් කරමු ද අම්මේ. කියා හඬමින් ඇයගේ මවට තුරුළු වෙමින් පවනී කීවා.

හොදයි බබා, අපි තාත්තටත් කියලා සදුනිට ඉගෙන ගන්න උදව් කරමු. පවනීගේ මව කීවා.



පසුදා පාසල් ගිය පවනී පංති කාමරයට ගොඩ වුනේ සදුනි ඉන්න තැන බලමින්. එවිට සදුනි පාසල්ට ඇවිත් තිබුණා. සදුනි ළගට ගිය පවනී " good morning, සදුනි දැන් ඔයාට කොහොමද? හොදින්නේද? පවනී ඇසුවා.

" good morning . පවනී. ඔව් දැන් මට හොදයි, සදුනි සතුටින් පිළිතුරු දුන්නා.

සදුනි හා පවනී දැන් හොද යාළුවෝ පාසල් වැඩ කටයුතු දෙදෙනා එකතු වි කළා. දෙදෙනාම පංතියේ හොදින් ඉගෙන ගත්තා. සදුනිට දැන් ගොඩාක් සතුටුයි. සදුනිගේ හොදම යාළුවා පවනී, පවනීගේ හොදම යාළුවා සදුනි.

පවනී නිතරම සදුනිගේ සහ එයාගේ අම්මාගේ දුක සැප වගේම අඩුපාඩු කම් සොයා බලමින් සදුනිගේ හොදම යෙහෙළිය වගේ ම ඇයගේ සහෝදරිය වුවා.

නිමි!.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථීක පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරණ කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියනෟ සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2025 - 02 - 05